3

# ශ්‍රී ලංකාවේ පුරාණ අමුණ හා සම්බන්ධ දේශපාලනික ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්*

චන්දන රෝහණ විතානාච්චි

## ප්‍රවේශය

මෙරට පැරණි වාරි කර්මාන්ත බිහිවීම කෙරෙහි බලපෑ දේශපාලනික ක්‍රියාකාරකම් හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම මෙරට පැරණි වාරි කර්මාන්ත පිළිබඳ පර්යේෂණයක දී ඉතා වැදගත් ය. අමුණ යනු, වාරි කර්මාන්තය තුළ ක්ෂණිකව බිහි වූවක් නොවී ය. එය ජනතාව විසින් ගොඩනඟන ලද්දේ එහි අවශ්‍යතාව වටහා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. අමුණු නිර්මාණය සඳහා දේශපාලන අධිකාරියේ සහභාගීත්වය සෘජු ව ම ලැබීම තුළින් පැහැදිලි වන්නේ අමුණ ආශ්‍රිත ව ප්‍රබල සාමාජීය වැදගත්කමක් පවතින බවයි. වියළි කලාපය ආශ්‍රිත ව සිදු වූ තත්කාලීන සමාජ පරිවර්තනය ඒ සඳහා බලපාන්නට ඇත. එම සමාජ විපර්යාසයන් ප්‍රධාන වශයෙන් දේශපාලනික ක්‍රියාකාරීත්වය මත ක්‍රියාත්මක වූ බව හඳුනාගත හැකි අතර අමුණු නිර්මාණය කෙරෙහි බලපෑ හේතූන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී එම කරුණු ඔස්සේ අවධානය යොමු කිරීම මගින් අමුණ ඉදිකිරීම කෙරෙහි පුරාතන මානව සමාජ යොමුවීමට මූලික වූ කරුණු සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීමට පුළුවන. මෙමගින් ශ්‍රී ලංකාවේ පුරාණ අමුණ හා සම්බන්ධ දේශපාලනික ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

* Please cite this article as: විතානාච්චි, සී.ආර්. (2020), ශ්‍රී ලංකාවේ පුරාණ අමුණ හා සම්බන්ධ දේශපාලනික ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්, *The Journal of Archaeology and Heritage Studies*, Vol. 5 Issue I, Chief Editor : C.B. Ambanwala, Rajarata University of Sri Lanka, Mihintale. pp 51-71

## පර්යේෂණ අරමුණ

ශ්‍රී ලංකාවේ පැරණි වාරි නිර්මාණ සම්බන්ධයෙන් විද්වතුන් විසින් විවිධාකාරයෙන් පර්යේෂණ කටයුතු සිදුකළ ද ක්‍රමයෙන් විනාශවෙමින් පවතින පුරාණ අමුණ සම්බන්ධයෙන් විධිමත් අධ්‍යයනයක් මෙම ලේඛකයා විසින් සිදුකරන තෙක් සිදු වී නොමැත. හෙන්රි පාකර් (1909:347-72) හා බ්‍රෝහියර් (1934) වැනි විද්වතුන් මෙරට ඇතැම් පුරාණ අමුණු සම්බන්ධයෙන් වාර්තාකර තිබුණ ද ඒවා ඉදිකිරීම කෙරෙහි මූලික වූ හේතූන් පිළිබඳ ව අවධානය යොමු කොට නැත. අමුණු නිර්මාණයේ දී ශ්‍රී ලංකාවේ පුරාතන සමාජයේ දේශපාලනික ක්‍රියාවලිය කෙතරම් වැදගත් වූයේ ද යන්න අනාවරණය කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

## න්‍යායාත්මක ප්‍රවේශය

පුරාවිද්‍යාව මගින් සමාජය විග්‍රහ කිරීමේ දී තනි තනි සිදුවීම් හා ඒවා අතර පවතින්නා වූ අන්තර් සම්බන්ධතාවන් තේරුම් ගැනීමට උත්සහා කරනු ලබයි. එවැනි සිදුවීම් එලෙස ක්‍රියාත්මක වීමට බලපෑ හේතු කාරණා කවරේ ද යන්න සම්බන්ධයෙන් අනුමානයන්ට එළඹීම ද එමගින් අපේක්ෂා කළ හැකි ය. ඒ අනුව, තනි ප්‍රපංචයක් ලෙසින් මෙන් ම ඒවා සමූහයක් වශයෙන් ඒකරාශී ව ගොඩනැඟී තිබූ සමාජීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය. එය පැහැදිලි කිරීමෙන් ඔබ්බට යා යුතු ක්‍රියාවලියකි. එනම් දැනුම ගොඩනැඟීමේ දී, ගොඩනඟා ගත් දැනුමේ වලංගු බව සහ විශ්වසනීය බව තහවුරු කිරීමට එම දැනුම වාස්තවික (Objective) විය යුතු වේ. ඒ අනුව පුරාවිද්‍යා විෂයය ක්ෂේත්‍රය තුළ අපගේ අරමුණ විය යුත්තේ අප ක්‍රියාත්මක වන යථාර්ථයේ පවතින්නා වූ විශේෂ බව තේරුම් ගැනීමයි. ඒ සඳහා විවිධ වූ න්‍යායාත්මක ප්‍රවේශයන් තුළ ප්‍රස්තුතයන් විග්‍රහ කිරීමේ හැකියාව පැවතිය හැකි ය. පුරාතන මානව සමාජයන්හී ආරම්භය සම්බන්ධයෙන් විමසීමේ දී පැහැදිලි වන්නේ එම සමාජ බිහිවීම ස්වභාවික ජල මූලාශ්‍රයන් ආශ්‍රිත ව සිදු වී තිබෙන බවයි. ගංගා, ඇළදොළ, විල් ආදී වශයෙන් පවතින එම ජල මූලාශ්‍රයන් සිය අධිපතීත්වය යටතට පත්කොට ගනිමින් මිනිසාට ප්‍රයෝජනය ලබාගත හැකි සැකස්මකින් යුතු වාරි කර්මාන්ත බිහිකරගෙන කෘෂි කර්මාන්තය ප්‍රධාන විවිධ අවශ්‍යතා සඳහා විධිමත් ජල සම්පාදන ක්‍රමවේදයක් ආරම්භ කිරීම මුල්ම ජලාශ්‍රිත ශිෂ්ටාචාර බිහිවීමට හේතු විය. එය ප්‍රාරම්භක දේශපාලනික ක්‍රියාවලියේ ප්‍රතිපලයක් විය.

වාරි කර්මාන්ත මගින් සමාජය කෙරෙහි ඇති වූ බලපෑම පිළිබඳ පුළුල් ලෙස අවධානය යොමු වී ඇති අයුරු හඳුනාගැනීමට පුළුවන (Wittfogel 1953, 1955, 1974; Leach 1959; Adams 1962, 1965, 1980). එසේ වුව ද, මෙම විග්‍රහයන් පිළිබඳ ව සමස්තයක් ලෙස ගෙන බැලූවිට පැහැදිලි වන්නේ ඒවා තුළින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකොට ඇත්තේ වාරි මාර්ගික සමාජය සම්බන්ධයෙන් වන බවයි.

මෙම න්‍යායාත්මක සංකල්පය පුරාණ ලාංකේය වාරි සමාජය සම්බන්ධයෙන් ද නොයෙකුත් විද්වතුන් විසින් විමසීමට ලක්කොට තිබේ. එඩ්මන්ඩ් ලීච්, ආර්.එල්.එච්. ගුණවර්ධනගේ අධ්‍යයනයන් ඒ අතර වැදගත් වේ (Leach 1959; Gunawardena 1971, 1978a, 1978b, 1981, 1982, 1984, 1989). ඩැනියල් පී. ලූක්ස් (Daniel P. Loucks) සහ පිරිස දක්වන ආකාරයට ගංගා නිම්න ආශ්‍රිත වාරි පද්ධතියක් දේශපාලන-පරිපාලන උප පද්ධතිය (Political-Administrative Sub System) යන උප පද්ධතියෙන් ද සමන්විත වේ (Loucks et al. 2005). දේශපාලන - පරිපාලන උප පද්ධති වාරි පද්ධතියේ වර්ධනය කෙරෙහි සෘජුව ම බලපා තිබේ. රාජ්‍යයත්වයේ සිට ග්‍රාමීය හෝ ගෝත්‍රික නායකත්වය දක්වා වූ සියලු ම ව්‍යුහයන් මේ පද්ධතිය තුළට අයත් වේ. රටක සියලු ම පරිපාලන ක්‍රියාවලීන් දේශපාලනය සමග බද්ධ වී තිබෙන බැවින් වාරි කර්මාන්තය කෙරෙහි ද එය එක සේ බලපා තිබෙන බව හඳුනාගත හැකි ය. ලෝකයේ පුරාණ වාරි කර්මාන්ත සඳහා දේශපාලනය සම්බන්ධ වී තිබේ. පුරාණ මිසර, ඉන්කා හා මෙසපොතේමියානු සමාජ රාජ්‍යය පාලනය යටතේ සපයන ලද වාරි ජලය මත යැපුණු බව පැහැදිලි කරන විට්ෆෝගල් (Wittfogel) ඒවායේ වාරි මාර්ගික කටයුතු පාලක මණ්ඩල කළමනාකාරීත්වයක් තුළ සකස් වූ බව පෙන්වා දී තිබීම (Wittfogel 1974:19) මෙයට නිදසුනකි. එසේ වුවද ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ ප්‍රභවය කෙරෙහි මුල් කාලීන ගෝත්‍රික නායකත්වයත් අනතුරුව රාජ්‍යය නායකත්වයත් මූලික වී තිබෙන බව අනාවරණය කරගැනීමට පුළුවන. එහෙත් එය විට්ෆෝගල් අදහස් කරන ආකාරයේ ක්‍රියාවලියක් නොවූ අතර ජනතා අවශ්‍යතාව තේරුම් ගැනීම තුළ සිදුවූවක් බව පැහැදිලි ය.

## විමර්ශනය

පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස විස්තීර්ණ ස්වභාවයක් ගැනීමත්, ඒවායේ ජන සංඛ්‍යාව ප්‍රමාණයෙන් අධික නොවීමත් හේතුවෙන් ජල මාර්ග හරහා තාවකාලික වැටි යොදාගනිමින් ජලය හරවා ගැනීම සහ විශාල නොවූ පස් වැටි භාවිතයෙන් කුඩා වැව් නිර්මාණය කරමින් අහස්දිය රැස්කර ගැනීම මත රැස්කර ගන්නා ජලය ඔවුනගේ අවශ්‍යතාවන් සඳහා ප්‍රමාණවත් වන්නට ඇත. මුල් ඓතිහාසික අවධියේ ජන ප්‍රසාරණයේ සිදු වූ සීඝ්‍ර වර්ධනය මත තවදුරටත් ඉහත ක්‍රම උපයෝගීත්වයෙන් ජලය රැස්කර ගැනීම ප්‍රමාණවත් නොවන බව දේශපාලන අධිකාරීත්වය ඇතුළු ජන සමාජය වටහා ගැනීම තුළ මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වාරි කර්මාන්ත ඉදිකිරීම කෙරෙහි යොමු වී තිබෙන බව පැහැදිලි ය. මෙහි දී වැව් ඉදිකිරීම හා ඇළ මාර්ග තැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකොට තිබෙන බව අභිලේඛන මූලාශ්‍රයන් ඇසුරින් අනාවරණය කරගැනීමට පුළුවන (*Ic*. Vol. ii: Nos.15, 16.ii, 19, 21, 37, 57, 60, 79, 84, 86, 101, 105, 131, 132, 141, 156, 169, 171.b-d, 175, 180, 183, 184, 191, 192). එවැනි විශාල වාරි නිර්මාණ සඳහා වර්ෂා ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් බාහිර මූලාශ්‍රය මගින් ඒ සඳහා ජලය ලබාදීමට අවධානය යොමුකිරීම මත අමුණේ

අවශ්‍යතාව දැඩිව ඉස්මතු වන්නට ඇති බව පැහැදිලි ය. ක්‍රිස්තු පූර්ව අවසාන භාගයේ සිට ක්‍රමයෙන් වර්ධනය වූ මෙම තත්ත්වය ලාංකේය සමාජය තුළ වඩාත් තීව්‍ර ලෙස ඉස්මතු වන්නේ ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමග බව තත්කාලීන අභිලේඛන හා වංසකථා මූලාශ්‍රයන් මගින් තහවුරු වේ (*එම*. Vol. i: Nos.1199, 1215; *Ez*. Vol. i: 252; *Ic*. Vol. ii: Nos.1, 96, 86, 88, 89, 100, 101; *මව*. iiiv: 84 සිට).

අමුණ මගින් වැව් සඳහා ජලය ලබාදීමට හැකිවීම මත වසරේ වැඩි කාලයක් වැව් සක්‍රිය තත්ත්වයෙන් පවත්වාගෙන යාමට සමත්වීම තුළ සාමාන්‍ය වැවේ වපසරියෙන් පෝෂණය කළ හැකි කෘෂි බිම් ප්‍රමාණයට වඩා වැඩි බිම් ප්‍රමාණයක් වගාකිරීමට හැකිවීම මත පෙරට වඩා විශාල පවුල් සංඛ්‍යාවක් නඩත්තු කිරීමට හැකියාව ලැබෙන්නට ඇත. ඒ අනුව, වියළි කලාපයේ ජන ප්‍රසාරණයේ තීව්‍රතාවට සාර්ථක ලෙස මුහුණ දීමේ අභියෝගය ජයගැනීම සඳහා අමුණ සක්‍රිය දායකත්වයක් සපයා තිබෙන අයුරු හඳුනාගැනීමට පුළුවන. මෝසම් වැසි රටාව වෙනස් වීම, ඇතැම් විටෙක දීර්ඝ කාලීන වශයෙන් පවතින වැසි රටාවන් හි බිඳවැටීම වැනි හේතූන් මත ජල අවශ්‍යතාව පවතින ප්‍රදේශයන් කරා ජලය ලබාදීම පිණිස ස්වාභාවික ජල මාර්ග මගින් ජලය සම්පාදනය කළ හැකි ස්ථාන හඳුනාගනිමින් අමුණු ඉදිකරන්නට ඇති බව උපකල්පනය කළ හැකි වේ. වාර්ෂික වර්ෂාපතන රටාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම අමුණකින් අපේක්ෂා කරන ලද එක් ප්‍රධාන වගකීමක් ලෙස දැක්විය හැකි ය.

රටක පරිපාලන ව්‍යුහය ප්‍රධාන වශයෙන් දේශපාලනික ක්‍රියාකාරීත්වය මත පදනම් ව ගොඩනැඟී තිබේ. එය ජන සමාජයේ සෑම අංශයක් සමග ම විවිධාකාරයෙන් සම්බන්ධ ව පවතින්නකි. වාරි කර්මාන්තය ගොඩනැඟීම සහ භාවිතය තුළ ද දේශපාලනික ක්‍රියාකාරකම් පුළුල් ලෙස දක්නට ලැබේ. පුරාණ දේශීය වාරි කර්මාන්තය විෂයෙහි අමුණ බිහිවීම කෙරෙහි බලපෑ දේශපාලනික ක්‍රියාකාරකම් කිහිපයක් හඳුනාගැනීමේ හැකියාව පවතී.

**දේශපාලන බලය තහවුරු කර ගැනීම**

පුරාතන ලංකාවේ දේශපාලන බලය තහවුරු කරගැනීම පිණිස උපයෝගී වූ ප්‍රධාන සාධකයක් ලෙස වාරි නිර්මාණ කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම හඳුනාගත හැකි ය. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් බවට පැමිණවීම රජුගේ ප්‍රධාන කාර්යයන් අතරට අයත් වූවක් විය. ඒ සඳහා අවශ්‍ය කරන විවිධ ක්‍රියාමාර්ග රාජ්‍යයත්වය මගින් ගෙන තිබෙන ආකාරය වසභ (ක්‍රි.ව. 67-111), මහාසේන (ක්‍රි.ව.274-301), පළමු වන විජයබාහු (ක්‍රි.ව. 1055-1110) සහ පළමු වන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1153-1186) වැනි රජවරුන් සම්බන්ධයෙන් සාක්ෂි මූලාශ්‍රයන් ඇසුරින් හඳුනාගැනීමට පුළුවන (*මව*.

xxxv: 70-100; xxxvii: 40-50; lx: 1-91; lxviii: 1-59; lxxix: 1-86). පුරාණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් කෘෂි කර්මාන්තය මත පදනම් ව ගොඩනැගී තිබෙන හෙයින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රාජ්‍යය වගකීමක් ලෙස පවතින්නට ඇත. එම යුගයේ දී කෘෂි කර්මාන්තය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වූයේ මෙරට වියළි කලාපය ආශ්‍රිත ව බැවින් ජල සම්පාදනයෙහි ලා විවිධ අපහසුතාවන් සිදුවන්නට ඉඩ තිබේ. ආරම්භක අවධියේ දී තුනී ජන විසිරුමක් පැවති හෙයින් ග්‍රාමීය වශයෙන් ඉදිකරගත් කුඩා වාරි ක්‍රම ඇසුරින් ජලය ලබාගැනීම ප්‍රමාණවත් වුවත් ක්‍රිස්තු වර්ෂාරම්භය වන විට සිදුවෙමින් පැවති ජනගහනයේ වර්ධනය හා සමාජයේ සංකීර්ණතාව හේතුවෙන් විශාල වාරි කර්මාන්තයන් හි අවශ්‍යතාව පැන නැගී තිබේ. එච්.ටී. බස්නායක පවසන්නේ ජනගහනය වර්ධනය වීමත් සමග ම ජල සම්පාදනය පිළිබඳ ගැටළුව රජයේ කාර්යභාරයක් බවට පත් වී තිබෙන බවයි (බස්නායක 2001: 191). එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසේ වසභ රජු විසින් විශාල වාරි නිර්මාණ තැනීම රාජ්‍ය කාර්යභාරයක් ලෙස සලකා ආරම්භ කළ බවත් මහසෙන් රාජ්‍ය අවධිය වන විට එය රාජ්‍ය ප්‍රතිපත්තියක් දක්වා වර්ධනය වූ බවත් ඔහු තවදුරටත් පැහැදිලි කොට තිබේ (එම). ඒ අනුව පෙනී යන්නේ රට තුළ දේශපාලන බලය තහවුරු කරගැනීමේ වැදගත් ක්‍රියාවලියක් ලෙසින් වාරි කර්මාන්තය සමග සම්බන්ධවීම හඳුනාගත හැකිව තිබෙන බවයි. වාරි කර්මාන්තයන් හි නියුතු වීම මගින් ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කරලීමට මහසෙන් රජු ගත් උත්සාහය වැදගත් වේ.

වාරි කර්මාන්ත භාවිතය ඇසුරින් දේශපාලන ස්ථාවර බව ගොඩනගාගත් රජවරුන් ගණනාවක් පිළිබඳ තොරතුරු අනුරාධපුර යුගයෙන් හමු වේ (*මව*. xxxv: 94-5; xxxviii: 47-50; xli: 30,34-5,68 ආදී). පොළොන්නරු යුගය වන විට වාරි කර්මාන්ත ඔස්සේ ජනතාවට සමීප වීම වඩාත් සංවිධානාත්මකව හා ශක්තිමත් ව සිදු වූ බව හඳුනාගත හැකි ය. පළමු වන විජයබාහු රජු රාජ්‍යයත්වයට පත්වීමෙන් පසු වැව් රාශියක් ම ප්‍රතිසංස්කරණයට ලක්කළ බවට වංසකථාවේ සඳහන් වීමෙන් (එම. lx: 48-54) පැහැදිලි වන්නේ ඒ වන විට කිසියම් ප්‍රමාණයකට හෝ බිඳ වැටී තිබුණු වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කරලීමට කටයුතු කරමින් අභියෝග මැද තමන් පිහිටුවා ගත් රජය තවදුරටත් ජනතාවට සමීප කරමින් බලය ස්ථාවර කර ගැනීමට සාධකයක් ලෙස යොදා ගන්නට ඇති බවයි. මෙහි උපරිම ඵලය නෙලාගත් පාලකයා වනුයේ පළමු වන පරාක්‍රමබාහු රජු ය. හෙතෙම බලයට පැමිණියේ නොයෙකුත් වියවුල් අතරින් බව මහාවංසයේ දැක්වෙන තොරතුරු අනුව පැහැදිලි වේ. ඉන් පසු රාජ්‍යයත්වය ස්ථාවර කරගැනීම පිණිස අවශ්‍ය බලය ගොඩනගා ගැනීම සඳහා ජනතාව වෙත සමීප වීමට ඔහු අනුගමනය කර ඇත්තේ වඩාත් පුළුල් හා සංවිධානාත්මක ලෙසින් වාරි කර්මාන්තයේ නියුතු වීම ය. පරාක්‍රමබාහු රජුගේ

ප්‍රතිපත්තිය වන *"පළමුව බොහෝ ධාන්‍ය රැස්කළ යුතු ය"* (එම. lx:7) යන ප්‍රකාශය අනුව ජනතාව ස්වයංපෝෂිත වීමේ අවශ්‍යතාව ඉස්මතු කොට දක්වා තිබෙන බව පෙනේ. ඒ සඳහා, රටේ වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි විවිධ පරිමාණයේ වාරි නිර්මාණ විශාල ප්‍රමාණයක් කරවීම හා ප්‍රතිසංස්කරණය තුළින් ජන ප්‍රසාදය ලබාගැනීම මගින් රටේ සෑම පෙදෙසක ම තම බලය ව්‍යාප්ත කරලීමට කටයුතු කර ඇත.

ජල පාලනය මගින් රට පාලනය කළ හැකි බවට වටහාගත් පුරාණ රජවරුන් අමුණ ඒ සඳහා උපයෝගී කරගත හැකි ප්‍රධාන වාරි තාක්ෂණික නිර්මාණයක් ලෙස හඳුනාගෙන කටයුතු කළ බව පැහැදිලි ය. වියළි කලාපය ආවරණය වන පරිදි නොයෙකුත් වැව් ඉදිකළ ද ඒවා වැසි ජලයෙන් පමණක් පෝෂණය වන්නේ නම් එම වැව්වල ක්‍රියාකාරීත්වය වඩාත් සක්‍රීය ව පවතින්නේ වර්ෂාව පවතින කාලය තුළ හා වර්ෂාව නිමා වී ආසන්න කාලය තුළ පමණි. එම වැව්වලට වෙනත් ජල සැපයුම් මාර්ග නොමැති වීම තුළ ඒවායේ ප්‍රයෝජනය ක්‍රමයෙන් හීන වී යනු ලැබේ. මෙවැනි තත්ත්වයන් මත විශාල ප්‍රමාණයේ වැව් සඳහා ජලය සම්පාදනය කරලීමට අතිරේක ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. අමුණෙහි ක්‍රියාකාරීත්වය ඒ සඳහා වඩාත් ප්‍රයෝජනවත් විය.

ස්වාභාවික මූලාශ්‍රයවල පවතින ජලය අමුණ මගින් පාලනය කිරීමට කටයුතු කිරීම තුළින් එම ජලයේ නතු බව දේශපාලන යාන්ත්‍රණය වෙත යොමු කර ගැනීමට රාජ්‍යයත්වය කටයුතු කළ බව පෙනී යයි. මෙමගින් නිගමනය කළහැකි වන්නේ ස්වාභාවික ජලය පාලනය කළ හැකි ප්‍රධාන තාක්ෂණික ව්‍යුහයක් ලෙස අමුණ පුරාතනයේ දී ක්‍රියාත්මක ව තිබෙන බව ය. මෙම තත්ත්වය පැරණි පාලකයින් මැනවින් වටහාගෙන කටයුතු කළ බව තහවුරු වන්නේ ඇතැම් රජවරුන් අමුණු නිර්මාණය සඳහා දැඩිව සම්බන්ධ වීම තුළ ය. ඇළ මාර්ග කරවීම පිළිබඳ වංසකථාවන් හි දැක්වෙන තොරතුරු (එම. xxxv: 84, 95; xxxvii: 49-50; xli: 35,51-72; lx: 52-4; lxviii: 23-38; lxxix: 25-7,52-5,67-8) විග්‍රහ කිරීමේ දී පැහැදිලි වන්නේ එම ඇළ මාර්ග බොහෝමයක් අමුණු පදනම් කරගනිමින් ආරම්භ වන බවකි. මෙම ඇළ මාර්ග ඇසුරින් වැව් පෝෂණය කිරීමට අවශ්‍ය ජලය ලබාදීම ප්‍රධාන අරමුණ වන්නට ඇත. ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසෙන් පසු ශිලා ලේඛනවල අමුණු පිළිබඳ වැඩි වශයෙන් සඳහන් වීමක් හඳුනාගත හැකි ය. ක්‍රිස්තු වර්ෂාරම්භයෙන් පසු අනෙකුත් වාරි කර්මාන්ත ඉදිවීමට සාපේක්ෂ ව එම වාරි නිර්මාණ සඳහා ජලය සම්පාදනය කිරීමේ ප්‍රධාන අරමුණින් යුතු ව ඍජු රාජකීය අනුග්‍රහය හා මෙහෙයවීම මත අමුණු ගොඩනගන්නට ඇති බව පෙනේ (*Ic*. Vol. i: Nos.1199,1215; ii: Nos.88, 100, 101 ආදී). තම දේශපාලනික බලය තහවුරු කරගැනීම පිණිස අමුණ උපයෝගී කරගත්

ප්‍රධානතම රජු ලෙසින් සැලකිය හැකි වන්නේ පළමු වන පරාක්‍රමබාහු රජු ය. මහාවංසයට අනුව හෙතෙම දක්ඛිණ දේශයේ පාලකයාව සිටි සමයේ දී ද, පොළොන්නරුවේ රාජ්‍යයත්වයට පත් වූ පසු ද කරවන ලද අමුණු ප්‍රමාණය ඉතා විශාල ය. ඔහු අමුණු 165ක් කරවන ලද බව සඳහන් ව තිබීමෙන් ඒ බව තහවුරු වේ (*මව.* lxxix:24-87; නිකොලස් 1971:528). ඒ අනුව පැහැදිලි වන්නේ වාරි කර්මාන්ත සංවර්ධනය කිරීම තුළින් දේශපාලනික වශයෙන් ස්ථාවර වීමට කටයුතු කිරීමේ ක්‍රියාවලිය තුළ ජල සම්පාදනයේ ප්‍රධාන වාරි තාක්‍ෂණික නිර්මාණයක් වශයෙන් අමුණේ දායකත්වය ඒ සඳහා ඍජු ව ම ලැබී තිබෙන බවකි.

**මධ්‍ය කේන්ද්‍රය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව ගොඩනැගීම**

දේශපාලනික ක්‍රියාවලියේ හඳුනාගත හැකි විශේෂ ලක්‍ෂණයක් වනුයේ මධ්‍ය කේන්ද්‍රය හෙවත් පරිපාලන කේන්ද්‍රස්ථානය තුළ ස්ථාපිත වෙමින් බාහිර පර්යන්තය හෙවත් පරිපාලිත සීමාව කරා බලය ව්‍යාප්ත කරවීමයි. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග රාජ්‍යයත්වය විසින් අනුගමනය කර තිබේ. ඒ අතර පවතින ප්‍රධානත ම සාධකයක් වන්නේ බාහිර පර්යන්තයේ පවතින පාරිසරික අභියෝගතාවන් හඳුනාගනිමින් ඒවා අවම කරගැනීමට දේශපාලනික නායකත්වය සැපයීමයි. රාජ්‍යයත්වය වාරි කර්මාන්තයේ සංවර්ධනය සඳහා ක්‍රමවත් ලෙස සම්බන්ධ වීම ආරම්භ කරනුයේ මෙරට වියළි කලාපීය ප්‍රදේශයේ පවතින ජල හිඟතාවට ක්‍රමවත් විසඳුමක් ලබාදීමේ අපේක්‍ෂාවෙන් වුව ද එය රජු හා ජනතාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව වර්ධනය කරලීමට හේතුවක් විය. ඒ අනුව මධ්‍ය හා බාහිර පර්යන්තය අතර තිබෙන දේශපාලනික බල සම්බන්ධතාව ප්‍රකාශ කරන ප්‍රධාන සාධකයක් ලෙසින් වාරි කර්මාන්තයේ නියුතු වීම ක්‍රියාත්මක වී ඇති බව හඳුනාගැනීමට පුළුවන. වාරි කර්මාන්ත සංවර්ධනය මගින් කෘෂි කර්මාන්තය දියුණු කරලීමට රාජ්‍යයත්වය සම්බන්ධ වීම යනු රජු සහ ජනතාව අතර සම්බන්ධතාව වර්ධනය වීමේ ප්‍රධාන පියවරකි. ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසින් පසුව සංවිධානාත්මක ලෙසින් මෙම ක්‍රියාවලිය සිදු වී තිබේ. වාරි කර්මාන්තය සඳහා ඍජු දායකත්වය ලබාදෙමින් ජලයේ පාලනය දේශපාලනික ක්‍රියාවලිය සමග සම්බන්ධ කරගැනීම තුළින් රජු හා ජනතාව නියෝජනය කරන මධ්‍ය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව වැඩිදියුණු කරගැනීමට රාජ්‍යයත්වය කටයුතු කර තිබෙන බව පැහැදිලි ය.

පර්යන්තීය ජනතාව මධ්‍යය කේන්ද්‍රය හෙවත් පරිපාලන කේන්ද්‍රයට පවතින නතු බව හෙවත් ඒකාග්‍රතාව උරගා බැලීම පිණිස අමුණ වැදගත් සාධකයක් වී ඇත. බොහෝ අමුණුවල උපයෝගීතාව කේන්ද්‍රගත වී පවතින්නේ අමුණ පිහිටි ස්ථානයට වඩා බොහෝ දුරස් වූ සීමාවක වන බැවින් බොහෝ දුරට අමුණ පිහිටි ප්‍රදේශයේ ජනතාවට ඉන් ප්‍රයෝජනයක් අත් නොවේ. ඇළහැර, මිණිපේ, දෙමද ඔය, තෙක්කම් වැනි අමුණුවලින් ජලය බොහෝ දුරස් වූ ප්‍රදේශවලට සම්පාදනය කරලීම මෙයට

නිදසුනකි. එබැවින් අමුණ පිහිටි ප්‍රදේශයේ ජනතාව එවැන්නක් ඉදිකිරීමට විරුද්ධ වීම හෝ ඉදිකළ පසු නොසලකා හැරීම හෝ වෙනත් විනාශකාරී ක්‍රියාවන්ට යොමු වීමට ඉඩ තිබේ. එම තත්ත්වය අමුණ ඉදිකළ ස්ථානයට පමණක් නොව ඇළ මාර්ග ආශ්‍රිත ප්‍රදේශයන්හී ද ඇතිවීමට පුළුවන. පුරාතනයේ එවැනි ක්‍රියාවන් සිදු වී ඇති බවක් වාර්තා නොවන්නේ පර්යන්තයන්හී ජනතාව රජුගේ අණසකට නතු වී සිටීම හෙවත් මධ්‍යයට ඒකාග්‍රකරගෙන සිටි නිසාවෙන් බව පැහැදිලි ය. එය මධ්‍යයේ බලය ජනතා සුභසාධනය මූලික කරගත් විවිධ ක්‍රියාමාර්ග මගින් පර්යන්තය වෙත මුදාහැරීමේ ක්‍රමවේදය මත සිදුවන්නට ඇත. ඒ අනුව අමුණ පිහිටි ස්ථානයේ සිට අතරමැදි ප්‍රදේශයන් හී ජනතාව තමාට නතුකර ගැනීම තුළින් වාරි කර්මාන්තය ආරක්ෂා කරගැනීම ප්‍රදේශවාසීන් මගින් ම සිදුකරගන්නට ඇති බව සිතිය හැකි වේ.

ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමග මෙම ක්‍රියාවලිය වඩාත් සංවිධානාත්මක ලෙසින් ආරම්භ වී ඇති බව වංසකථා හා අභිලේඛන මූලාශ්‍රයන් මගින් අනාවරණය කර ගැනීමට පුළුවන. මධ්‍ය කේන්ද්‍රයෙන් බැහැර වූ බාහිර පර්යන්තවල රාජකීය අනුග්‍රහය යටතේ ඉදිකරන ලද වාරි නිර්මාණ විශාල සංඛ්‍යාවක් සම්බන්ධ තොරතුරු එම මූලාශ්‍රයන් මගින් හෙළිකර ගැනීමේ හැකියාව පවතී.

| මහරඣ නාමය | සෙල්ලිපිය පිහිටි ස්ථානය හා Ic Vol I හි අංකය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| මහරඣ ගමිණි අබය | කොස්වාකන්ද 193 | අනුරාධපුර |
| ගමිණි තිශ මහරඣ | මහඇළගමුව 211 | අනුරාධපුර |
| දෙවනපිය මහරඣ ගමිණි තිශ | රිටිගල ආඬියාකන්ද 236 | අනුරාධපුර |
| දෙවනපිය තිශ මහරඣ | රිටිගල ආඬියාකන්ද 236 | අනුරාධපුර |
| දෙවනපිය මහරඣශ ගමිණි තිශ | දඹුල්ල 835 | මාතලේ |
| මහරඣශ ගමිණි අබය | කුඹුරුලෙන 894-5 | කුරුණෑගල |
| ගමණි අබය පිත මහරඣ | නුවර කන්ද 913 | කුරුණෑගල |
| දෙවනපිය මහරඣශ ගමිණි අබය | සැස්සේරුව 994 | කුරුණෑගල |
| දෙවනපිය මහරඣ ගමිණි අබය | ගල්ලෙන විහාරය 1018-27 | කුරුණෑගල |
| මහරඣ | එම 1028 | කුරුණෑගල |
| මහරඣ පණිත | තෝරව මයිලෑව 1035 | කුරුණෑගල |
| දෙවනපිය මහරඣශ ගමිණි අබය | තෝනිගල 1051-2 | පුත්තලම |
| මහරඣ දෙවනපිය | පිච්චන්දියාව 1054 | පුත්තලම |

**අධ්‍යයන සීමාව තුළ පිහිටි සෙල්ලිපි අතර ආරම්භක අවධියේ අගනුවර මධ්‍ය කේන්ද්‍රයෙන් බැහැරව මහරජු පිළිබඳ සඳහන් වන පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි**

පුරාණ අමුණ, මධ්‍ය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව පවත්වාගෙන යාම සඳහා වැදගත් සාධකයක් ලෙසින් ආකාර කිහිපයකින් ක්‍රියාත්මක වී ඇත.

අ. බාහිර පර්යන්ත අතර එකඟතාවන් ගොඩනගා ගැනීම
ආ. මධ්‍ය කේන්ද්‍රයේ සම්බන්ධතාවන් තහවුරු කරගැනීම සඳහා අමුණු උපයෝගී කර ගැනීම
ඇ. මධ්‍ය කේන්ද්‍රය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව තහවුරු කරගැනීම පිණිස අමුණ උපයෝගී කර ගැනීම.

**අ.** පුරාතන අමුණ, බාහිර පර්යන්ත අතර එකඟතාව ගොඩනැංවීම පිණිස ක්‍රියාත්මකව පැවති බවට අමුණු ස්ථාපිත කරතිබෙන ස්ථාන මගින් අනාවරණය කර ගැනීමට හැකියාව පවතී. ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසේ වසභ රජු විසින් ඇළහැර අමුණ ඉදිකිරීමෙන් එක් බාහිර පර්යන්තයක පවතින ජල සම්පත වඩාත් දුර බැහැරින් වූ වෙනත් බාහිර පර්යන්තයකට යැවීමට කටයුතු කිරීමෙන් අනාවරණය වන්නේ එක් බාහිර පර්යන්තයක් පෝෂණය කිරීම සඳහා තවත් බාහිර පර්යන්තයක තිබෙන ජල සම්පත යොදාගෙන තිබෙන ආකාරයයි. මේ ආකාරයට එක් බාහිර පර්යන්තයක සම්පතක් වූ ජලය වෙනත් බාහිර පර්යන්තයකට යැවීමට කටයුතු කිරීමේ දී අමුණ පිහිටි බාහිර පර්යන්තය සමග එකඟතාවකට පැමිණීමට රජුට සිදුවන්නට ඇත. එය සිදුකරන්නට ඇත්තේ ජලය සම්පාදනය කෙරෙන මුල් බාහිර පර්යන්තය හා ජලය භාවිත කරන දෙ වන බාහිර පර්යන්තය අතර ජන ප්‍රසාදය රජු විසින් දිනාගැනීම මගිනි. ඔවුනගේ අවශ්‍යතාවන් රජු විසින් ඉටුකරලීම තුළින් එම ප්‍රසාදය දිනාගන්නට ඇත. ඒ සඳහා අනුගමනය කරන්නට ඇති එක් ක්‍රියාමාර්ගයක් වන්නේ අමුණ පිහිටි ස්ථානයේ සිට ආරම්භ වන ප්‍රධාන ඇළ මාර්ගයෙන් යොදා තිබෙන කෙත් ඇළ මාර්ග මගින් ඇළ මග දෙ පස ජනතාවගේ ජල අවශ්‍යතාවන් ඉටුකරලීම ය. පුරාණ ඇළ මාර්ග ඇසුරෙහි යොදා තිබෙන කුඩා ගල් දොරටු ඇසුරින් ජලය කෙත් ඇළවල් වෙතට මුදාහැරීම සිදුකර තිබෙන බවට සාක්ෂි හඳුනාගත හැකි ය. මෙවැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් අමුණු කර්මාන්තයේ ආරක්ෂාව ජනතාව විසින් ම සලස්වාලීම කෙරෙහි රාජ්‍යයත්වයේ අවධානය යොමු වී තිබෙන්නට ඇත. එය සිදුවන්නේ බාහිර පර්යන්තයේ අවශ්‍යතාවන් තේරුම් ගෙන ඒවා ඉටුකිරීමට කටයුතු කිරීම මගින් රජු ගොඩනඟාගත් සම්බන්ධතාවේ ශක්තිමත් භාවය මත ය.

පළමු වන අග්ගබෝධි රජු විසින් කරවන්නට යෙදුනු මිණිපේ අමුණ (එම. xli:35) මගින් හා දෙ වන උදය රජු විසින් *මහානදී* හෙවත් වළවේ ගඟ හරස් කොට ඉදිකරන ලද අමුණ මගින් (නිකොලස් 1961:301-2) තවදුරටත් සනාථ වන්නේ මධ්‍ය පර්යන්තයෙන් බොහෝ දුරස් වූ බාහිර පර්යන්තයන් කෙරෙහි සම්බන්ධතාව ගොඩනඟා ගැනීමට අමුණ වැදගත් සාධකයක් වී පැවති බවයි. අමුණු මගින් නිකුත්

කරන ජලය හේතුවෙන් බාහිර පර්යන්තවල වාසය කරන ජනතාවගේ ජීවන පැවැත්ම යහපත් වීම තුළින් එම පර්යන්ත අතර සම්බන්ධතාව වඩා ශක්තිමත් ලෙස තහවුරු වන්නට ඇති අතර එමගින් වාරි කර්මාන්තයේ සංවර්ධනයට දායක වූ රජුට හිමිවන ජනතා ප්‍රසාදය වැඩි වන්නට ඇත.

**ආ.** මධ්‍ය කේන්ද්‍රගත ප්‍රදේශ ආශ්‍රිත ජල සම්පාදන ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් අමුණු පදනම් කරගෙන සිදු වූ බවට සාක්ෂි ඇත. මධ්‍ය කේන්ද්‍රය සමග සම්බන්ධ වීම සඳහා අමුණ උපයෝගී කරගත් බවට තොරතුරු වංසකථාවෙන් අනාවරණය වී තිබේ. සේන ගුත්තික රජවරුන් විසින් මල්වතු ඔයේ අමුණක් බැඳ අනුරාධපුර ආශ්‍රිත නාගරික ජල සම්පාදනය ක්‍රමවත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වංසකථාවේ සඳහන් වීම (*වසපකා.* xv:207) මගින් තහවුරු වන්නේ මධ්‍ය කේන්ද්‍රයේ ප්‍රධාන නගරයට ජල සම්පාදනය කිරීම සඳහා අමුණ උපයෝගී වූ ආකාරයයි. මීට අමතර ව නටබුන් වශයෙන් හඳුනාගත හැකි අමුණු කීපයක් පිළිබඳ ව සාක්ෂි මධ්‍ය කේන්ද්‍රයේ ප්‍රධාන නගරය වූ අනුරාධපුරය හා තදාශ්‍රිත ව ගලා බසින මල්වතු ඔයේ දක්නට ලැබේ. ඉන් එක් අමුණක් වන්නේ නාගරික ජල සම්පාදනයේ ප්‍රධාන වැවක් වූ නුවර වැවට ජලය සැපයීම පිණිස මල්වතු ඔයේ කරවන ලද ශෛලමය අමුණ (Brohier 1934 Part ii:11) ය. නුවර වැව යනු මධ්‍ය කේන්ද්‍රයේ පිහිටි වැවක් වන අතර, එහි ජලය ප්‍රධාන වශයෙන් අනුරාධපුර නගරයට හා තදාශ්‍රිත ප්‍රදේශයේ අවශ්‍යතාවන් සඳහා යොමු කර තිබේ. පොළොන්නරු යුගයේ මධ්‍ය කේන්ද්‍රය ක්‍රියාත්මක වී ඇත්තේ පොළොන්නරුව අගනුවර කේන්ද්‍ර කොට ගනිමිනි. එහි ජල අවශ්‍යතාවන් ඉටුකරලීම පිණිස පළමු වන පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද පරාක්‍රම සමුද්‍රයට අවශ්‍ය ජලය ලබාදීම පිණිස පුරාණ කාරගංගා හෙවත් අඹන් ගඟ හරස් කොට අංගම්මැඩිල්ල ලෙස වර්තමානයේ හැඳින්වෙන අමුණ ගොඩනඟා ආකාශ ගංගා නම් විශාල ඇළ මඟ කරවීමෙන් (*මව.* lxxix: 25-7) සනාථ වන්නේ මධ්‍ය කේන්ද්‍රය නියෝජනය කරන නාගරික ප්‍රදේශ සඳහා ජල සම්පාදන ක්‍රමවේදයක් ලෙස අමුණ භාවිත කළ බව ය.

**ඇ.** මධ්‍ය කේන්ද්‍රය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව ගොඩනැංවීම පිණිස අමුණ උපයෝගී කරගෙන තිබේ. අගනුවර ලෙස ක්‍රියාත්මක වූ මධ්‍ය කේන්ද්‍රය හා එහි දාරය ආශ්‍රිත සීමිත ප්‍රදේශ තුළ වැඩි ජන සනත්වයක් වර්තමානයේ මෙන් ම පුරාණයේ ද සිටින්නට ඇත. ඒ බව අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශවලින් හමුවන පුරාවිද්‍යාත්මක සාධකවලින් තහවුරු කර ගැනීමට පුළුවන. විවිධ අවශ්‍යතාවන් සපුරාගැනීම පිණිස දිනපතා අගනුවර වෙත පැමිණෙන ජනතාවගේ ප්‍රමාණය ද ඉහළ මට්ටමක පවතින්නට ඇත. මධ්‍ය කේන්ද්‍රය ආශ්‍රිත ජන සනත්වය ඉහළ නංවන මෙම දෙපිරිසගේ ම අවශ්‍යතාවන් සැපිරීම පිණිස මධ්‍ය කේන්ද්‍රය තුළ තිබෙන සීමිත සම්පත් ඔවුනට ප්‍රමාණවත් නොවන්නට ඇත. ජලය ද එවැනි ම සීමිත සම්පතක්

විය. අනුරාධපුර යුගයේ මධ්‍ය කේන්ද්‍රය වන අනුරාධපුරය ආශ්‍රිත ව ක්‍රමයෙන් ජනගහනය වැඩි වූ බවට එක් සාධකයක් වන්නේ සීමිත වපසරියක් තුළ ඉදිකළ වැව් සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ යාම ය. මෙලෙස වැඩිවන වැව් සඳහා අවශ්‍යවන ජලය එම ප්‍රදේශය තුළින් ලබාගැනීම අසීරු වූ බැවින් ඒ සඳහා විකල්ප ලෙස අනුගමනය කර ඇත්තේ බාහිර පර්යන්තයක පවතින ජලය මධ්‍ය කේන්ද්‍රය වෙත ලබා ගැනීමට කටයුතු කිරීමයි. ඒ සඳහා පුරාණයේ උපයෝගී කරගෙන ඇත්තේ අමුණ ය. දෙ වන මහින්ද (ක්‍රි.ව. 777-797) රජු විසින් බාහිර පර්යන්තයක පිහිටි නාලන්දා ප්‍රදේශයේ දී දෙමද ඔය හරහා අමුණු බැඳ කලා වැවට අතිරේක ජලය ලබාදීමට පියවර ගැනීම (නිකොලස් 1979:343) මගින් අනුරාධපුර නගරය ආශ්‍රිත ප්‍රධාන වැව්වලට අමතර ජලය ලබාදීම සඳහා ධාතුසේන රජු විසින් කර වූ යෝධ ඇළේ ජල ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම මීට නිදසුන් වේ. මීට අමතර ව මිරිස්ගෝනියා ඔයේ බඳින ලද අමුණකින් මල්වතු ඔයට ජලය ලබාගත් බවට හඳුනාගත හැකි ඇළ මාර්ගයක සාක්ෂි වර්තමානයේ ද ශේෂව පවතී. මෙම අමුණ මගින් මල්වතු ඔයේ ජල ප්‍රමාණය වැඩි කොට මල්වතු ඔයෙන් පෝෂණය ලබන අනුරාධපුර මධ්‍ය කේන්ද්‍රය සඳහා අතිරේක ජල ප්‍රමාණයක් මුදාහැරිම බව පැහැදිලි ය. ඒ අනුව මධ්‍ය කේන්ද්‍රය පෝෂණය කිරීමේ කාර්යය සඳහා බාහිර පර්යන්තයක ඉදිකරන ලද ඇතැම් අමුණුවල සෘජු දායකත්වය ලැබී තිබෙන බව හඳුනාගැනීමට පුළුවන. බාහිර පර්යන්ත දාරයේ පවතින ජලය මධ්‍ය කේන්ද්‍රය කෙරෙහි යොමු කර ගැනීමට මූලික වූයේ අමුණ බව මෙයින් තහවුරු වේ. ඒ සඳහා මධ්‍ය කේන්ද්‍රය හා බාහිර පර්යන්තය අතර අන්‍යෝන්‍ය අවබෝධතාවක් ක්‍රියාත්මක වන්නට ඇත. මධ්‍ය කේන්ද්‍රය නියෝජනය කරන රජු බාහිර පර්යන්තය නියෝජනය කරන සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට සහාය ලබාදීම මගින් එම අවබෝධය ලබා දෙන්නට ඇත.

**මහා සංස්කෘතිය හා ක්ෂුද්‍ර සංස්කෘතිය අතර සම්බන්ධතාව ගොඩනැගීම**

මහා සංස්කෘතිය හා ක්ෂුද්‍ර සංස්කෘතිය අතර සම්බන්ධතාව ගොඩනඟන සාධකයක් ලෙස අමුණ ක්‍රියාත්මක වී ඇත. මහා සංස්කෘතිය ප්‍රධාන වශයෙන් ගොඩනැගෙනුයේ මධ්‍ය කේන්ද්‍ර කරගනිමිනි. අනුරාධපුර යුගයේ මහා ශිෂ්ටාචාරය එකළ අගනුවර වූ අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතවත් පොළොන්නරු යුගයේ එය පොළොන්නරුව හා තදාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතවත් ගොඩනැගුණි. අනුරාධපුරය හා පොළොන්නරුව ආශ්‍රිත ව දක්නට ලැබෙන විශාල ප්‍රමාණයක් වන පුරාවිද්‍යාත්මක නටබුන් මගින් මහා ශිෂ්ටාචාරයේ නැගීම හඳුනාගත හැකි ය. එය දේශපාලනික හා ආගමික සම්බන්ධතාවන් සහිත ව ශක්තිමත් වූවක් ලෙසින් පැවතී තිබුණ බව වංසකථා මූලාශ්‍රයන් මගින් පමණක් නොව පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් ද තහවුරු වන්නකි.

රටක බොහෝ ක්‍රියාකාරකම් මූලික වශයෙන් ක්‍රියාත්මක වූයේ මහා සංස්කෘතියේ අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ අභිලාශයෙනි. බාහිර පර්යන්ත ප්‍රදේශවල ගොඩනැගී

පැවති විසිරුම් ස්වභාවයක් සහිත වූ ක්ෂුද්‍ර සංස්කෘතීන් හී අවශ්‍යතාවන් රාජ්‍යයත්වය මගින් නිසි ලෙස සපුරාලීම සිදු නොකළහොත් මහා සංස්කෘතියේ පෝෂණයට අවශ්‍ය සැපයුම් ක්ෂුද්‍ර සංස්කෘතීන් මගින් නොසැපයෙනවා පමණක් නොව ඔවුන් මහා සංස්කෘතියට එරෙහි ව නැගී සිටීමට ද ඉඩ තිබේ. මේ තත්ත්වය වටහා ගත් මහා සංස්කෘතිය නියෝජනය කරන රාජ්‍යයත්වය ක්ෂුද්‍ර සංස්කෘතීන් පෝෂණය කිරීමේ කාර්යය තම වගකීමක් කොට සළකා ක්‍රියාකර තිබේ. එහි එක් අංශයක් වන්නේ වියළි කලාපීය ක්ෂුද්‍ර සංස්කෘතීන්වලට අවශ්‍ය ජල සම්පාදනය උදෙසා වාරි කර්මාන්ත ගොඩනැඟීමේ කාර්යයේ නිරත වීමට රජු කටයුතු කර තිබීමයි. අනුරාධපුර හා පොළොන්නරු නගරයන්ට පරිබාහිර ව රාජකීය අනුග්‍රහය යටතේ ඉදි වූ පුරාණ වාරි මාර්ගවලින් ඉගි සැපයෙනුයේ ඒ ඒ ප්‍රදේශ ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ ක්ෂුද්‍ර සංස්කෘතීන් පෝෂණය කිරීම කෙරෙහි රාජ්‍යයත්වයේ අවධානය යොමුවූ බවට ය.

මෙරට පුරාණ අමුණ සම්බන්ධ නටබුන්වල පිහිටීම පිළිබඳව අවධානය යොමු කරන විට පැහැදිලි ව හඳුනාගත හැකි කාරණයක් වනුයේ එම අමුණුවල වැඩි ව්‍යාප්තියක් මහා සංස්කෘතිය ගොඩනැගී තිබුණු භූමියෙන් පරිබාහිරව ස්ථාපිත වී තිබෙන බවයි. කලා ඔය, දැදුරු ඔය, වළවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, මහවැලි ගඟ සහ යාන් ඔය ආශ්‍රිත ව හඳුනාගත හැකි පැරණි අමුණු අතරින් වැඩි ප්‍රමාණයක් බාහිර පර්යන්තය තුළ ස්ථාපිත කොට ඒවා ඇසුරින් එම පර්යන්තය ආශ්‍රිත ප්‍රදේශවලට හා දුර බැහැර ප්‍රදේශවලට ජලය සැපයීමට කටයුතු කර තිබේ. මින් පැහැදිලි වන්නේ එම අමුණු භාවිතයෙන් ක්ෂුද්‍ර සංස්කෘතීන්හි ජල අවශ්‍යතාවන් සපුරාලීමට කටයුතු කිරීම මගින් දේශපාලනික නායකත්වය නියෝජනය කරන මහා ශිෂ්ටාචාරය හා සාමාන්‍ය ජනතාව නියෝජනය කරන ක්ෂුද්‍ර සංස්කෘතීන් අතර සම්බන්ධතාව ශක්තිමත් කරලීමට කටයුතු කර තිබෙන ආකාරයයි. වසභ රජු විසින් කරවන ලද ඇළහැර අමුණ, පළමු වන අග්ගබෝධි රජු විසින් කරවන ලද මිණිපේ අමුණ, දෙවන උදය රජු වළවේ ගඟ ආශ්‍රිත ව කරන ලද අමුණු නිර්මාණය, *මහාගල්ලකවාපි* හෙවත් මාගල්ලේ වැවට ජලය සම්පාදනය කිරීම පිණිස මහසෙන් රජු විසින් දැදුරු ඔය ආශ්‍රිත ව කරවන්නට ඇතැයි අනුමාන කළ හැකි අමුණ (*මව.* xxxv: 84, 95; xxxvii: 49-50; xli: 35; li: 72; lx: 52-4), පළමු වන පරාක්‍රමබාහු රජු විසින් දක්ඛිණ දේශය සංවර්ධනය කිරීමේ අභිලාශයෙන් දැදුරු ඔය ආශ්‍රිත ව කරවන ලද අමුණු ජාලය (එම. lxviii:3-38; lxxix:67-8) මගින් මහා සංස්කෘතියෙන් පරිබාහිරව පැවති ක්ෂුද්‍ර සංස්කෘතීන් පෝෂණය කිරීම සම්බන්ධයෙන් අමුණ පදනම් කොට ගනිමින් දේශපාලන නායකත්වය සම්බන්ධ වීම පිළිබඳ ව අදහසක් ලබාගැනීමට පුළුවන.

**ජන සම්බන්ධතාව වර්ධනය කරලීම**

දේශපාලනික හා ආගමික ක්‍රියාකාරීත්වයන් ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූයේ සමාජයේ ප්‍රභූ යයි සම්මත ජනතාව සමග ය. ප්‍රධාන වශයෙන් මෙම ජනතාව සම්බන්ධ වන්නේ මහා සංස්කෘතිය සමග ය. ඔවුහු බොහෝ විට දේශපාලනික, වාණිජ හා ආගමික ක්‍රියාකාරීත්වයන් සමග ඍජු සම්බන්ධතාවක් දක්වා ඇත. දේශපාලනික හෝ පරිපාලන මධ්‍යස්ථාන හා ආගමික නිර්මාණ ගොඩනැගීම කෙරෙහි මෙම කණ්ඩායම්හී දායකත්වය ඉහළ මට්ටමකින් පැවති බව හඳුනාගත හැකි ය. ක්‍රිස්තු පූර්ව 300 සිට ක්‍රිස්තු වර්ෂ 100 දක්වා කාලය තුළ ක්‍රියාත්මක වූ සංකීර්ණ සමාජ සැකැස්මේ හඳුනාගත හැකි වූ සමාජ ස්තරගත වීම තුළ උඩුපිල නියෝජනය කරනු ලබන ප්‍රභූ සමාජය **මහරජ, රජ, පරුමක, ගමණි, ගමික, ගපති, බරත, බත, අය, අශ** ආදී වශයෙන් වූ පදවි සහ සමාජ ස්තර කේන්ද්‍රකර ගනිමින් සකස් වී තිබේ (Ic. Vol. i:lxxix; මෙන්ඩිස් 2011:369). මෙම පිරිස් සමාජයේ විවිධ ක්ෂේත්‍ර සමග සම්බන්ධ වී එම ක්ෂේත්‍රවල නායකත්වය ගෙන කටයුතු කිරීම පිළිබඳ තොරතුරු තත්කාලීන පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන ඇසුරින් අනාවරණය කරගත හැකි ය. ඒ අතර සිටින පරුමකවරුන් වැව් භාරකරුවන්, නගුල් මෙහෙයවන්නන්, භූමි පාලකයින්, තොටුපළ පාලනය කරන්නන්, භාණ්ඩාගාරිකයින්, සේනාධිපතියන්, නගර පාලකයින් ආදී වශයෙන් විවිධ ක්‍රියාකාරී අංශයන් සමග සම්බන්ධ වී සිටින ආකාරය හඳුනාගැනීමට පුළුවන. නගර ආශ්‍රිත ව ප්‍රධාන වශයෙන් වාසය කරනුයේ මෙම කොටසට අයත් සමාජ පන්තීන් වන අතර ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටුවන පරිදි නාගරික සැළසුම්කරණය සිදු වී ඇත. ඒ බව පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැළසුම් කිරීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ගවලින් පැහැදිලි වේ (මව. x:75-105). වසභ රජු නගර ප්‍රාකාරය ශක්තිමත් කොට බැන්දවීම, උද්‍යාන හා පොකුණු ආදිය තැනවීම (එම. xxxv: 95-8) මගින් පැහැදිලි වන්නේ ප්‍රභූ ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම බව සිතිය හැකි ය.

| **මුල් හා අපර බ්‍රාහ්මී ශිලාලේඛන පවතින ස්ථානය** | **වාර්තා ගත වූ යොමු අංකය *Ic.* Vol. i** | **කෘෂි කර්ම, කර්මාන්ත, ශිල්ප හා වෙළෙඳාම ඇතුළු කාර්යයන් සඳහා දායකත්වය** |
|---|---|---|
| රිටිගල මරක්කල උල්පත | No 260 | පරුමක නගුලි (නගුල මෙහෙයවන්නා) |
| සීගිරිය | No 869 | පරුමක නගුලි (නගුල මෙහෙයවන්නා) |
| හදගල | No 1130, 1132 | පරුමක වපි හමික (වැව් භාරකරු) |
| අවුකන | No 1149 | පරුමක තණ භූමික භොජික (තණ භූමි පාලකයා) |

| | | |
|---|---|---|
| අවුකන | No 1150 | පරුමක භූමික භොජික (භූමි පාලක) |
| අවුකන | No 1151 | පරුමක කඩපි වපි හමික (වැව් භාරකරු) |
| අවුකන | No 1153 | පරුමක ගජ ද බුනක වපිහමික (වැව් භාරකරු) |
| තෝරව මයිලෑව | No 1217, No 1218 | පරුමක වව් හමික (වැව් භාරකරු) |
| බෙරවාගම | No 142 | පරුමක වියගහ (සීසෑම කටයුතු භාරකරු) |
| කන්දලම | No 860 | පරුමක තොට බොජික (තොටුපළ පාලනය කරන්නා) |
| මිහින්තලය | No 22 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය | No. 44 | පරුමක චුඩ (මැණික්කරු) |
| මිහින්තලය රාජගිරි කන්ද | No. 59 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය රාජගිරි කන්ද | No. 63 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය රාජගිරි කන්ද | No. 64 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| හදගල විහාරය | No. 125 | පරුමක චුඩ (මැණික්කරු) |
| බුදුගේහින්න | No. 203 | පරුමක චුඩ (මැණික්කරු) |
| රිටිගල | No. 251 | පරුමක මහාසේනාපති (මහසෙන්පති) |
| රිටිගල | No. 266 | පරුමක චුඩ නගහ (චුඩ නාග) |
| කුරුනෑකල්ලු | No. 319 | පරුමක තබර (තඹකරු) |
| කුරුනෑකල්ලු | No. 320 | පරුමක පුකියන (වෙළඳ කුලය) |
| තෝරව මයිලෑව | No. 1037 | පරුමක නගර බොජක (නගරයේ අයබදු එකතු කරන්නා) |
| තෝරව මයිලෑව | No. 1219 | පරුමක නගර ගුත (නගර පාලක) |
| ගල්කන්දේගම | No. 171 | පරුමක බොජික (ගම් පාලකයා හා අයබදු එකතු කරන්නා) |
| ගල්කන්දේගම | No. 172 | පරුමක බොජික (ගම් පාලකයා හා අයබදු එකතු කරන්නා) |
| මහඇලගමුව | No. 217 | පරුමක ගනක (ගණන් තබන්නා) |
| මහඇලගමුව | No. 230 | පරුමක නගර ගුත (නගර පාලක) |
| මිහින්තලය | No. 39 | ගමිකබඩගරික (භාණ්ඩාගාරික) |
| මුතුගල | No. 309 | ගමික තොඩික (තොටුපල පාලක) |
| කන්දේගම කන්ද | No. 295 | ගහපති දූතක (දූතසේවාව) |
| කන්දේගම කන්ද | No. 297 | ගහපති චුඩික (මැණික්කරු) |
| මුතුගල | No. 301 | ගහපති කබර (යකඩකරු) |

**පරුමකවරු ඇතුළු සමාජ ස්තර විවිධ ක්ෂේත්‍රවල නායකත්වය ගෙන කටයුතු කිරීම පිළිබඳ තත්කාලීන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන සමහරක්**

ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස ආරම්භ වන තෙක් සියලු ම දේශපාලනික ක්‍රියාකාරීත්වයන් ප්‍රධාන වශයෙන් සංවිධානය වී පැවතියේ අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ ය. ඒ අනුව අනුරාධපුර රාජධානි සමය තුළ ප්‍රධාන වශයෙන් ශක්තිමත් වීම සිදුවී ඇත්තේ ප්‍රභූ පන්තිය සහ සමීපතයින් සමග පමණි. පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය නිර්මාණය කොට එයට අවශ්‍ය සියලුම පහසුකම් සැපයීම (එම. x:75-105), මුටසිව රජු අනුරාධපුරයේ මහාමේඝ වනෝද්‍යානය පිහිටුවීම (එම. xi:2-4), දෙවනපෑතිස් රජු අනුරාධපුරය ආශ්‍රිත ව බෞද්ධාගමික මධ්‍යස්ථාන පිහිටුවීම (එම. xv:222-6), දුටුගැමුණු රජු අනුරාධපුරය ආශ්‍රිත ව සුවිසල් වෙහෙරවිහාර කරවීම (එම. xxvi:13-8; xxvii:17-21; xxviii:3 සිට) ආදී කටයුතු මධ්‍ය කේන්ද්‍ර කරගත් ජනතාව මූලික කරගනිමින් සිදුකළ කාර්යයන් අතරින් කීපයකි.

සමාජයේ ක්‍රියාකාරීත්වය සඳහා අනෙකුත් සමාජ ස්තර නියෝජනය කරන රටේ සාමාන්‍ය ජනතාවගේ දායකත්වය වැදගත් සාධකයක් වූ බව දේශපාලන ක්‍රියාකාරීත්වය මගින් හඳුනාගෙන තිබුණු බැවින් ඔවුනගේ අවශ්‍යතාවන් පිළිබඳ ව සොයා බැලීමටත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමටත් පියවර ගෙන තිබේ. මෙම තත්ත්වය හඳුනාගනිමින් එම ජනතාව කෙරෙහි වඩාත් ක්‍රමවත් ලෙස අවධානය යොමු කළ ප්‍රථම පාලකයා වන්නේ වසභ රජු ය. අගනුවරින් බැහැර වූ පර්යන්ත ප්‍රදේශවල වාසය කළ සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම කෙරෙහි වසභ රජු උනන්දුවෙන් කටයුතු කළ බව සනාථ වන්නේ ඔහු විසින් ප්‍රාදේශීය වශයෙන් කරවන ලද වාරි නිර්මාණ මගිනි. ඊට අමතර ව හෙතෙම අගනුවරින් බැහැර ව ආගමික කටයුතු පවා සිදුකළ බව වංසකථාවෙන් තොරතුරු අනාවරණය වේ (එම. xxxv:80-9).

ප්‍රභූ ජනතාව නියෝජනය කරන ජන කණ්ඩායම්වල අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ පණ්ඩුකාභය, මහසෙන්, ධාතුසේන, පළමු ව පරාක්‍රමබාහු වැනි රජවරුන් තම ජයග්‍රාහී ඉලක්කයන් කරා ගමන් කොට ඇත්තේ නිවැරදි ලෙසින් යටිපෙළ නියෝජනය කරන සාමාන්‍ය ජනතාව ආමන්ත්‍රණය කොට ඔවුන් මෙහෙයවීමට කටයුතු කිරීමෙන් බව පැහැදිලි ය. මහසෙන් රජු තමාට එරෙහි ව අනුරාධපුර අගනුවර පැනනැගුණු ආගමික හා දේශපාලනික විරෝධතාවන් මර්ධනය කරලීමට උපයෝගී කර ගනු ලැබූයේ සාමාන්‍ය ජනතාව සමග නිවැරදි සම්බන්ධතාවන් ඇති කර ගැනීම ය. ඒ සඳහා මහසෙන් රජු බාහිර පර්යන්තය තුළ වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් ද, වාරි කර්මාන්ත රාශියක් ද කරවා තිබේ (එම. xxxvii:40-50). ඒ අනුව තමාට විරුද්ධව පෙළ ගැසුණු අගනුවර ශක්තිය හා හමුදා බලය මර්ධනය කරගැනීමට පිටස්තර බලය සමග ගොඩනැගුණු ජනතා ශක්තිය මහසෙන් රජු විසින් උපයෝගී කරගත් බව පැහැදිලි ය.

සාමාන්‍ය ජනතාව සමග සම්බන්ධ වීම උදෙසා රාජ්‍යයත්වය අනුගමනය කළ වැදගත් ක්‍රියාවලියක් වූයේ ප්‍රාදේශීය වශයෙන් වාරි කර්මාන්තයේ නියුතු වෙමින් ඔවුනගේ ජල අවශ්‍යතාවන් සපුරාලීමට කටයුතු කිරීම ය. විවිධ අභියෝගතාවන් තුළින් රාජ්‍යයත්වයට පත් මහසෙන්, ධාතුසේන, පළමු වන පරාක්‍රමබාහු වැනි රජවරුන් තමන්ගේ පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කිරීමේ දී සාමාන්‍ය ජනතාවගේ සහාය ලබා ගැනීමට වාරි කර්මාන්තයේ නියුතු වීම උපයෝගී කරගත් බව පැහැදිලි වන්නේ මෙරට රජවරුන්ගේ වාරි කර්මාන්ත වැඩි ප්‍රමාණයක් අගනුවරින් පරිබාහිර වූ යටිපිල ජනතාව නියෝජනය කරන පර්යන්ත ප්‍රදේශවල ඉදි වූ බවට සාක්ෂි අනාවරණය කර ගැනීමට හැකි වීමෙනි.

ප්‍රභූ හා සාමාන්‍ය ජනතාව අතර ශක්තිමත් සබඳතාවක් ගොඩනැංවීම පිණිස වාරි කර්මාන්තය තුළ අමුණු නිර්මාණය ද උපයෝගී කරගත් බව හඳුනාගැනීමේ හැකියාව තිබේ. ස්වාභාවික ජල මාර්ගවල පවතින ජලය වෙනතකට යොමු කිරීමේ ප්‍රධාන තාක්ෂණික නිර්මාණය වන අමුණ ඇසුරින් සාමාන්‍ය ජනතාව වාසය කරන, ජල සම්පාදනයේ අවශ්‍යතාව ඇති ප්‍රදේශ කරා ජලය සැපයීමට කටයුතු කිරීම මගින් එම ජනතාවගේ කෘෂි කාර්මික අරමුණු ප්‍රධාන කොටගත් අනෙකුත් පරිභෝජන අවශ්‍යතාවන් සාක්ෂාත් කර ගැනීමට සැළැස්වීම මගින් ඔවුනගේ සන්තුෂ්ටිය ඉහළ නැංවීමට ප්‍රභූ පංතිය නියෝජනය කරන දේශපාලන තන්ත්‍රය කටයුතු කර තිබෙන බව පැහැදිලි ය. සැමවිට ම වර්ෂාව කෙරෙහි අපේක්ෂාවන් තබාගත නොහැකි බැවින් රාජ්‍යත්වයේ මැදිහත්වීමෙන් ඉදිකරන ලද විශාල වැව් සඳහා අවශ්‍ය ජලය සැපයීම පිණිස ආසන්නයේ හෝ දුරබැහැර පිහිටි ජල මාර්ගවල ඉදිකරන ලද අමුණු ඉතා ඵලදායී විය. මෙහි ප්‍රයෝජනය උපරිම ලෙස අත්විඳිනු ලැබූයේ සාමාන්‍ය ජනතාව බව අමුණු පිළිබඳ සාක්ෂි හමුවන ස්ථාන ඇසුරින් සනාථ වේ. ඒ අනුව **අමුණ** යනු ප්‍රභූ සමාජය නියෝජනය කරන දේශපාලන අධිකාරිය මගින් සාමාන්‍ය ජනතාව වෙත ලබාදුන් මහඟු දායාදයක් බව හඳුනාගැනීමට පුළුවන. පළමු වන පරාක්‍රමබාහු රජු විසින් මහවැලි ගඟ ආශ්‍රිත ව කරන ලද කාලිංග අමුණින් ඇරඹෙන **අචිරවතී** සහ **ගෝමතී** යන ඇළ මාර්ග ජල සම්පාදනය කිරීම (එම. lxxix:52-4) එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශාවන්හී පිහිටි සාමාන්‍ය ජනතාව වාසය කළ භූමි ප්‍රදේශයන් ඉලක්ක කරගෙන සිදු වූ බව හඳුනාගැනීමට හැකි වීමෙන් ඉහත සම්බන්ධතාව මැනවින් පැහැදිලි වේ.

ධාතුසේන රජු මන්නාරම ප්‍රදේශයට ආසන්නයේ යෝධ වැව කරවන ලද්දේ එම භූමියේ පැවති කෘෂි කර්මයට සුදුසු පාරිසරික රටාව කෙරෙහි අවධානය යොමු කරමින් බව සිතීමට පුළුවන. එම භූමියෙහි වටිනාකම හඳුනාගනිමින් වැවක් මගින් එම භූමියට ජලය සැපයිය හැකි බවට යෝජනා කරන්නට ඇත්තේ ප්‍රභූ හා සාමාන්‍ය

සමාජ අතර සම්බන්ධතාව ඇති කරන සාමාන්‍ය ජනතාව නියෝජනය කරන නායකත්වයන් මගින් විය හැකි ය. මෙම වැව සඳහා ජලය ලබාගැනීමේ මූලාශ්‍රය ද පාරිසරික අත්දැකීම් මගින් සාමාන්‍ය ජනතාව නියෝජනය කරන නායකත්වය විසින් ධාතුසේන රජුට දැන්වූවේ යැයි සිතිය හැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් නායකත්වය විසින් මල්වතු ඔය හරස් කොට වර්තමානයේ **තෙක්කම්** නමින් හැඳින්වෙන පුරාණ අමුණ ඉදිකරන්නට ඇත. එයින් පැහැදිලි වන්නේ රාජ්‍යයත්වය මගින් අවශ්‍යතාවන් හඳුනාගනිමින් අමුණු ස්ථාපිත කිරීමට කටයුතු කිරීම තුළින් සාමාන්‍ය ජනතාව සමග සම්බන්ධතාව ගොඩනගා ගැනීමට කටයුතු කර තිබෙන බවයි. වසභ රජු විසින් ඇළහැර අමුණ කරනු ලැබීමත් පශ්චාත් කාලීන රජවරුන් විසින් එය කීප වතාවක් ම ප්‍රතිසංස්කරණය කරනු ලැබීම කටයුතු කිරීමත් මගින් පැහැදිලි වන්නේ සාමාන්‍ය ජනතාව සම්බන්ධයෙන් බොහෝ රජවරු අවධානයෙන් සොයා බලා කටයුතු කළ බවයි.

**ජලයේ මූල්‍ය වටිනාකම හඳුනාගැනීම**

වාරි කර්මාන්තය මගින් ජලයේ පාලනය රාජ්‍යයත්වය මූලික වූ දේශපාලන අධිකාරීත්වය යටතට ගැනීම තුළ අපේක්‍ෂා කරන ලද ප්‍රධාන කාරණයක් වූයේ විධිමත් ජල කළමනාකරණය තුළ එහි උපරිම ප්‍රයෝජනය ජනතාව වෙත ලබාදීම බව නිසැක ය. කෘෂි කාර්මික අර්ථ ක්‍රමයක් තුළ ජලයේ අවශ්‍යතාව ප්‍රබල ලෙස ඉස්මතුවන බැවින් ජල සම්පාදන ක්‍රියාවලිය සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රිස්තු වර්ෂාරම්භයේ සිට ම සකස් වී තිබිණ (සිරිවීර 1994:49; බස්නායක 2001:191).

ජලය ආර්ථික සාධකයක් ලෙස යොදාගත් බවට සාක්‍ෂි තත්කාලීන අභිලේඛන මූලාශ්‍රයන් ඇසුරින් අනාවරණය කරගත හැකි ය. **දකපති** (*Ic*. Vol. ii: Nos.45.2; 78.6; 115.4), **දකපෙත** (*Ez*. Vol. i: No.14.3), **දකබක** (*Ic*. Vol. ii: 38.a), **දකබලි** (එම.: No.14.1), **දකබුක** (එම.: No.79) වැනි සඳහන්වලින් ඒ බව තහවුරු වේ. ***දක*** යනු පාලියේ ජලය හැඳින්වීමට යෙදෙන ***උදක*** යන්නෙන් සකස් වූවකි (රණවැල්ල 2004:124). ***පති, පෙත, බක, බලි, බුක*** යන්නෙන් බදු යන්න ව්‍යවහාර වේ (එම.:179,209,215,223). මේ හැර ***බුජිය පති, බොජක පති*** හෝ ***බොජිය පති*** යනුවෙන් ද මෙවැනි බදු හඳුන්වා තිබෙන බව සෙල්ලිපිවලින් අනාවරණය වේ (*Ic*. Vol. ii: Nos.37, 41, 46, 60, 63, 78). ඒ අනුව පැහැදිලි වන්නේ ජලය සඳහා බදු මුදල් අයකළ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක ව පැවති බවයි.

ජලයට මූල්‍යයමය වටිනාකමක් හිමිකර දීමේ දී අමුණේ කාර්යභාරය ඉතා වැදගත් වී තිබේ. ස්වාභාවික සම්පතක් වන ජලය සඳහා වාරි කර්මාන්තය තුළ මූල්‍ය වටිනාකමක් ලබාදෙමින් එය රජයේ ආදායම් මාර්ගයක් බවට පත්කර ගැනීම සඳහා

ජලය තමා වෙතට නතුකර ගැනීම සඳහා උපයෝගී වූ ප්‍රධාන තාක්‍ෂණික නිර්මාණය ලෙස අමුණ සැලකිය හැකි වේ. ස්වාභාවිකව ගලා බසින ජලය අමුණු බැම්මක් මගින් හරවා වැව්වලට හෝ වෙනත් ක්ෂේත්‍රයන් වෙත යොමුකිරීම මගින් ජලයේ පාලනය ආරම්භ වන අතර ඉන්පසු එම ජලය කෘෂි කර්මාන්තය ඇතුළු අදාල කාර්යයන් වෙත නිකුත් කරනු ලබන්නේ නිශ්චිත ක්‍රමවේදයක් තුළ ය. ඒ පිළිබඳ අදහසක් අමුණක් පිළිබඳව සඳහන් ඉරිපින්නියාව සෙල් ලිපිය ඇසුරින් ලබාගත හැකි ය (*Ez* Vol. i:No.12; *Ic*. Vol. v:No.39.6). එහි දැක්නෙ **දිය බෙදුම්** යන වචනය සම්බන්ධයෙන් අදහස් දක්වන ඩී.එම්. ඉසෙඩ්. වික්‍රමසිංහ පවසන්නේ ජලය බෙදාහැරීම සම්බන්ධයෙන් දැක්වෙන බවයි (*Ez* Vol. i:No.12). මෙය ජල පංගු ක්‍රමයක් විය හැකි බව රණවැල්ල පවසා සිටී (*Ic*. Vol. v:No.39.6).

වැව්වල ජලය භාවිතය සම්බන්ධයෙන් බදු අයකිරීම පිළිබඳ ව තොරතුරු සෙල්ලිපි ඇසුරින් හඳුනාගත හැකි සේ ම අමුණු භාවිතය තුළ බදු මුදල් අයකළ බව තහවුරු කෙරෙන සාක්ෂි හමු වී තිබේ. ජේතවනාරාම ලිපියක **මහනිලදරක** හා **මිචනකිවචි** නම් අමුණුවල ආදායම සමග වැව් කිහිපයක ආදායම අභයගිරි විහාරය වෙත ලබාදුන් බව සඳහන් වීම මෙයට එක් නිදසුනකි (*Ez*. Vol. i:No.22). සෝමාවතී චේතිය පුවරු ලිපියේ සඳහන් ***වසනක කුළෙ මහ අවරණහි බලි....*** යන්න විග්‍රහ කරන පරණවිතාන පවසන්නේ මෙම අමුණින් අයකරන ලද බදු මුදල් පිළිබඳ අදහසක් ඉන් ඇතිකරගත හැකි බවය (*Ic*. Vol. ii:No.89). අමුණු මගින් නිකුත් කළ ජලය සඳහා බදු අයකළ බව කණිට්ඨතිස්ස (ක්‍රි.ව. 167-186) රජුගේ කාලයට අයත් අභයගිරි මළුවේ ලිපියේ සඳහන් ***අවරණ ච මෙවනක වවහි ච අවරණා හී ච දකපති ...*** (*එම*. No.96) යන පාඨයෙන් තවදුරටත් තහවුරු වේ. අමුණු පිළිබඳ සඳහන් වන රුවන්වැලි සෑ පුවරු ලිපිය, දක්ඛිණ ථූප මළුවේ ලිපිය, පුවරසන්කුලම ගිරි ලිපිය (*එම*. Nos.88,100,101) ඇතුළු ලිපි රාශියක ම දැක්වෙන තොරතුරු අනුව පැහැදිලි වන්නේ එම ලිපිවල සඳහන් වැව් අමුණුවල ආදායම් විහාරස්ථාන වෙත ලැබීමට සලස්වා තිබෙන බවයි. බදු මුදල් යන්න සෘජු ව ම සඳහන් නොවූවත් ***මෙතුවාක් වැව්වල ද අමුණුවල ද දිය බදු*** එහි සඳහන් වේ. මේ දිය බදු මුදල්වලින් අයකර ගන්නට ඇත. අයක වැනි නිලධාරීන් (*Ic*. Vol.289, 647; *Ez*. Vol.v:27.1 ආදී) පත්කර සිටියේ එවැනි කාර්යයන් සඳහා විය හැකි ය.

**සමාලෝචනය**

වාරි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ අමුණ ඉදිකිරීම සහ එය සංවිධානාත්මක ව ව්‍යාප්තවීම කෙරෙහි බලපා තිබේ. දේශපාලන බලය තහවුරු කර ගැනීම, ජලය පාලනය කළ හැකි වීම, මධ්‍ය කේන්ද්‍රය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව ගොඩනැගීම,

මහා සංස්කෘතිය හා ක්‍ෂුද්‍ර සංස්කෘතිය අතර සම්බන්ධතාව පවත්වාගෙන යෑම, ජන සම්බන්ධතාව වර්ධනය කරලීම සහ ජලයේ මූල්‍ය වටිනාකම හඳුනාගැනීම වැනි අංශ ඒ අතරින් වැදගත් වේ. ඒ අනුව පැහැදිලි වන්නේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම තුළින් දේශපාලනික වශයෙන් ස්ථාවර වීමට කටයුතු කිරීමේ ක්‍රියාවලිය තුළ ජල සම්පාදනයේ ප්‍රධාන වාරි තාක්‍ෂණික නිර්මාණයක් වශයෙන් අමුණේ දායකත්වය ඒ සඳහා සෘජු ව ම ලැබී තිබෙන බවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


නිකලස්, සී.ඩබ්ලියු. (1961), පුරාණ වාරිමාර්ග ක්‍රම, *අනුරාධපුර යුගය*, සංස්කරණය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය, 289-304හට පිටු.

නිකලස්, සී.ඩබ්ලියු. (1979), පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, *රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාවේ සඟරාව,* පරිවර්තනය.

බස්නායක, එච්.ටී. (1997), පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*මහාවංසය*, සිංහල (1967), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්‍ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව (මව).

මෙන්ඩිස්, ඩී.ටී. (2010), *පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව සිදු කෙරෙන පුරාවිද්‍යා අධ්‍යයනයක්*, අප්‍රකාශිත දර්ශන විශාරද උපාධි නිබන්ධනය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ.

රණවැල්ල, එස්. (2004), *සිංහල සෙල් ලිපි වදන් අකාරාදිය*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

*වංසත්ථප්පකාසිනී* (මහාවංස ටීකාව) (1994), සිංහල අනුවාදය අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

Adams, Robert Mc C. 1962, A synopsis of the historical demography and ecology of the Diyala River Basin, Central Iraq, Civilization in desert lands. In ed. Richard B. Woodbury, *Anthropological Papers*, No. 62, Department of Anthropology, University of Utah, pp.15-29.

Adams, Robert Mc C. 1974, *Historic Patterns of Mesopotamian Irrigation Agriculture*, eds. T. Downing, McGuire Gibson.

Brohier, R.L. 1934 (1979), *Ancient Irrigation Works in Ceylon*. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.

*Epigraphia Zeylanica Vol. i.* 1912, eds. D.M. De. Z. Wickramasinghe, London, Published for the Government of Ceylon, Oxford University Press (Ez).

*Epigraphia Zeylanica Vol. ii.* 1928, eds. D.M. De. Z. Wickramasinghe, London, Published for the Government of Ceylon, Oxford University Press (Ez).

*Epigraphia Zeylanica Vol. v. Part. i.,* 1955, eds. S. Paranavitana, Archaeological Survey of Ceylon (Ez).

Gunawardana, R.A.L.H. 1971, Irrigation and Hydraulic society in Early Medieval Ceylon, *Past and present*, No.53: pp.3-27.

Gunawardana, R.A.L.H. 1978a, Hydraulic engineering in ancient Sri Lanka: the cistern sluices. In Indrapala, Prematilleke and van Lohuizen-de Leeuw, editors, *Senerat Paranavitana commemoration volume. Studies in South Asian Culture.* Vol. VII, Leiden: E.J. Beill, pp.61-74.

Gunawardana, R.A.L.H. 1978b, Social function and political power: A case study of state formation in irrigation society. *Indian Historical Review*, Vol. iv, No.2: pp.259-273.

Gunawardana, R.A.L.H. 1981, Social Function and political power: A case study of sate formation in Irrigation Society, *The study of the state*, ed. Henri, J.M. Claessen and peter Skalnik, The Hague, Mouton publishers: pp.133-154.

Gunawardana, R.A.L.H. 1982, Prelude to the state An Early phase in the Evolution of Political Institutions in Ancient Sri Lanka, *The Sri Lanka Journal of the Humanities*, Vol. VIII, No .1&2: pp.1-39.

Gunawardana, R.A.L.H. 1984, Cistern sluice and the piston sluice*, Sri Lanka Journal of Humanities*, Vol.X.No.1&2: pp.87-104.

Gunawardana, R.A.L.H. 1989, The ancient sluice at the Maduru Oya reservoir: Experimentation in Sri Lankan traditions of hydraulic engineering. In de Silva, C.R. and Kiribamune, Sirima, editors, *K.W. Gunawardhana felicitation volume. Special issue. Modern Sri Lanka Studies*, *(1987)*, Peradeniya, Vol. II: pp.01-20.

*Inscription of Ceylon* Vol.i. Part. i. 1970, eds. S. Paranavitana, Colombo, Department of Archaeology (Ic).

*Inscription of Ceylon* Vol. ii. Part. i. 1983, eds. S. Paranavitana, Colombo, Department of Archaeology (Ic).

*Inscription of Ceylon* Vol. ii. *Part ii.* 2001, S. Paranavitana, eds. Malini Dais, Colombo, Archaeological Survey Department (Ic).

*Inscription of Ceylon* Vol.v. *Part i.* 2001, eds. Sirimal Ranawella, Colombo, Archaeological Survey Department (Ic).

Leach, E.R. 1959, Hydraulic society in Ceylon, *Past and Present* No.15, pp.2-26.

Loucks, Daniel P., Van Beek, Eelco., Stedinger, Jery R., Dijkman, Jozef and P.M., Villars, Monique T., 2005, *Water Resources System Planning and Management: An Introduction to Methods, Models and Applications*. UNESCO.

Parker, H. 1909 (1981), ***Ancient Ceylon***, New Delhi, Asian Educational Services.

Siriweera. W.I. 1994, *A Study of the Economic History of Pre Modern Sri Lanka*, New Delhi.

Wittfogel, Karl A. 1953, The ruling bureaucracy of Oriental despotism: A phenomenon that paralyzed Marx, *Review of Politics*, 15, No. 2

Wittfogel, Karl A. 1957, *Oriental despotism: a comparative study of total power*, New Haven, Yale University Press.

Wittfogel, Karl A. 1974(1955), Developmental aspects of hydraulic societies, *Rise and fall of civilizations. Modern archaeological approaches to ancient cultures. Selected Readings*, ed. Karlosky, C.C. and Sabloff, Jeremy, A., California, Harvard University.